# ශ්‍රී ලංකා පාසල් චෙස් සංගමය

)අධ්‍යාපන අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා පාසල් ක්‍රීඩා සභාවට අනුබද්ධිතයි(

# இலங்கை பாடசாலைகள் சதுரங்க சங்கம்

)இலங்கை பாடசாலைகள் விளையாட்டு சபையுடன் இணைக்கப்பட்டுள்ளது(

# SRI LANKA SCHOOLS' CHESS ASSOCIATION

(Affiliated to Schools Sports Council, Ministry of Education, Sri Lanka)


| PRESIDENT: | SECRETARY: | TREASURER: |
|---|---|---|
| K.H.Ranjith Thilakaratne<br>G/Saint Aloysius College,<br>Galle<br>**Mob:0771187417**<br>ranjittthilakaratne@gmail.com | L.R.M.Hemantha Rathnayake<br>R/Kalawana National School,<br>Kalawana<br>**Mob:0717301788** hemanthachess@gmail.com | M.F. Priyanthi Cooray<br>Nu/Our Lady's School,<br>Nuwara Eliya<br>**Mob:0714924923** Priyanthicooray1@gmail.com |


ශ්‍රී ලංකා පාසල් චෙස් සංගමයේ සියළු පාසල් ප්‍රධානීන් වෙත.

*2017.06*.16

<u>2017 කේවල චෙස් උළෙල හා තරගාවලී අවසන් චෙස් උළෙල පැවැත්වීම</u>
<u>(2017 ජුනි මස 23 සිකුරාදා සහ 24 සෙනසුරාදා දෙදින - ගාල්ල ශාන්ත ඇලෝසියස් විදුහල කේන්ද්‍රීයව)</u>

ශ්‍රී ලංකා පාසල් චෙස් සංගමය මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන උක්ත චෙස් ඉසව්ව සංවිධානය කොට පැවැත්වීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ - ක්‍රීඩා ගේ අංක ED/9/15/2/3/3/7 හා 2017.03.17 දිනැති ලිපියෙන් අප සංගමය වෙත අනුමැතිය ලැබී ඇති අවසරය පරිදි මෙම චෙස් තරගාවලිය දිස්ත්‍රික් මට්ටමින් සංවිධානය කොට පවත්වන ලදී.

ආපදා තත්වයන් මත කල් තබන ලද මෙම තරගාවලිය එහි අවසන් තරගාවලිය අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතියට යටත්ව 2017 ජුනි මස 23 සහ 24 දෙදින - ගාල්ල ශාන්ත ඇලෝසියස් විදුහල කේන්ද්‍රීයව පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත.

එබැවින් 2017 කේවල අවසන් චෙස් තරගාවලිය සඳහා එම කටයුතු සාර්ථකව කරගැනීම සඳහා පහත සඳහන් කටයුතු නොපමාව සිදු කරන ලෙස ඉල්ලා සිටිමි.

1. ඔබට අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මට්ටමේ පැවති මූලික තරගවලින් මේ සඳහා තේරී පත්වූ නමුත් මෙතෙක් අවසන් තරගවල ලියා පදිංචි කර නොගත් සියළුම ක්‍රීඩක කීඩිකාවන් 2017 ජුනි මස 20 අඟහරුවාදා දිනහෝ ඊට පෙර ලියාපදිංචි කර නිම කිරීම.
මේ සඳහා විද්‍යාල මට්ටමින් අදාල දිස්ත්‍රික් තරගාවලිය සංවිධානය කළ සංවිධායක නැතිනම් තරගාවලී කමිටුව දුරකථන මගින් අමතා අවස්ථාව ලබා ගන්න.
ඒ සඳහා සංගමයේ ගාස්තු ගෙවීමේ පිළිවෙත සහ තොරතුරු දිස්ත්‍රික් තරගාවලී /උළෙල කැඳවීම් ලිපියෙහි දක්වා ඇත.

2. අවසන් තරගවලට තේරීමේ ක්‍රමවේදය.

**කේවල චෙස් උළෙල.**

දිස්ත්‍රික් තරගාවලියේ දී ත්‍රී ස්ටාර් පරිසාධන මට්ටම ලබා ගැනීම හා අවසන් වටයට පසු ශ්‍රේණිගත ලේඛණයේ කඳ විසඳුමට (ටයි බ්‍රේක්) අනුව මුල්ම 20 ක දෙනා අතරට අයත්වන **යන අවශ්‍යතා දෙකම සපුරාලන** ක්‍රීඩකයන්/ක්‍රීඩිකාවන් අවසන් උළෙල සඳහා ඉදිරිපත්විමට සුදුසුකම් ලබයි.

**කේවල චෙස් තරග.**

**දිස්ත්‍රක් තේරීම් තරග වලදී ක්‍රීඩාකර 1, 2 ,3 ස්ථාන ලබා ගන්නා අය අවසන් තරග සඳහා සුදුසුකම් ලබන අතර සහභාගීත්වය 6 ට වැඩිවන සෑම 06 දෙනෙකුට එක් අයෙකුටම එක් අයෙකු බැගින් තෝරා ගනු ලැබේ.**
**කෙසේ වෙතත් එක් දිස්ත්‍රික්කයකින් උපරිම ක්‍රීඩක සංඛ්‍යාව 20 කට සීමාවේ.**
**එසේම දිස්ත්‍රික් තරගාවලියේ 1, 2 ,3 ස්ථාන ලබා ගත් ක්‍රීඩකයන් හැර 4 ස්ථානයේ හෝ ඊට පහල ශ්‍රේණිගතවී ඇති ක්‍රීඩකයන් අවම වශයෙන් මුළු ලකුණු වලින් 50 % කට වඩා ලබා තිබිය යුතුය.**

උදා ක්‍රීඩකයන් 01 සිට 06 දෙනෙකුට 03 ක් ද,
ක්‍රීඩකයන් 07 සිට 12 දෙනෙකුට 04 ක් ද,
ක්‍රීඩකයන් 13 සිට 18 දෙනෙකුට 05 ක් ද,
ක්‍රීඩකයන් 19 සිට 24 දෙනෙකුට 06 ක් ද,
ක්‍රීඩකයන් 25 සිට 30 දෙනෙකුට 07 ක් ද,

3. අවසන් උළෙල /තරග සඳහා තේරෙන තරගකරුවන් ඊට අදාළ තරග ගාස්තු ඉහත රු 500/= (රුපියල් පන්සියය) සංගමයේ බැංකු ගිණුමට ගෙවූ රිසිට්පත 2017 ජුනි මස 20 අතහරුවාදා දින හෝ ඊට පෙර අදාල දිස්ත්‍රික් සංවිධායක වෙත ඉදිරිපත්කර තරගයේ පූර්ව ලියාපදිංචිය විය යුතුය.

4. ගාස්තු හා ගෙවීම්.

i. පාසලේ 2017 වාර්ෂික සාමාජික ගාස්තුව

ඔබ පාසල 2017 වර්ෂය ශ්‍රී ලංකා පාසල් චෙස් සංගමයේ සාමාජික ගාස්තු ව ගෙවීම අනිවාර්යවේ. (මෙතෙක් නොගෙවූ පාසල්වලට පමණි)
එය රජයේ පාසලකින් රුපියල් හත් සීයක්ද (රු 700)
ජාත්‍යන්තර පාසලකින් රුපියල් එක්දහස් පන්සීයක් (රු 1500/=) වෙයි.

ii. අවසන් තරග ගාස්තුව

එක් ක්‍රීඩකයකකුගෙන් /ක්‍රීඩිකාවකගෙන් රු.350 /= කි. පාසලක් විසින් අයදුම් කරන සියළුම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අදාලව මුළු තරග ගාස්තුවම එකවරම සංගමයේ ගිණුම්ගත කර තරග ලියාපදිංචියේදී පාසල් අයදුම්පතට අමුණා ඉදිරිපත්කළ යුතුය.
චෙක් පත් - ශ්‍රී ලංකා පාසල් චෙස් සංගමය- (Sri Lanka Schools Chess Association) නමට ලිවිය යුතුයි.
සංගමයේ සාමාජික ගාස්තුව හා පාසල් ලියා පදිංචි ගාස්තු වෙනම ගෙවීම් දෙකක් ලෙස මුදලින් හෝ චෙක් පත්වලින් ශ්‍රී ලංකා පාසල් චෙස් සංගමයේ - මහජන බැංකුවේ 086100130014267 අංක දරණ තිඹිරිගස්යාය ශාඛාවේ ගිණුමට තැන්පත් කළ යුතුය.
ඒ සඳහා ලැබෙන රිසිට් පත් දෙක වෙන වෙනම පාසල් අයදුම් පතට අමුණා තිබිය යුතුයි.

5. තරග පවත්වන දින 2017.ජුනිමස23සහ24 (උදේ07.30ට වාර්තා කළ යුතුය.
ස්ථාන

1. 7 න් පහළ බාලක සහ බාලිකා ගා/උස්වතුන් හසානා විද්‍යාලය -දෙවට පාර,ගාල්ල
2. 9.11.13.15.17.20 ගා / ශාන්ත ඇලෝසියස් විදුහල -කළුවැල්ල,ගාල්ල

6. තරග නීති රීති දිස්ත්‍රික් තරගයේ කැඳවීම් ලිපියේ පරිදි වේ.

7. එක් එක් දිස්ත්‍රික් සංවිධායකවරුන් ගේ සම්බන්ධතා පහත දැක්වේ.

| | දිස්ත්‍රික්කය | | සංවිධායක | දුරකථන අංක |
|---|---|---|---|---|
| 1 | හම්බන්තොට | | නිමල් අබේපිටිය මහතා | 0714492642 |
| 2 | මාතර | | හේමන්ත රත්නායක මහතා | 0717301788 |
| 3 | ගාල්ල | | ජයන්ත අසේල මහතා | 0778515671 |
| 4 | කලුතර | | ශානිකා ලියනාරච්චි මහත්මිය | 0771262762 |
| 5 | කොළඹ | (7,9 වයස් කාණ්ඩ) | රංජිත් වික්‍රමරත්න මහතා | 0772770848 |
| | | (11,13,15,17,20 වයස් කාණ්ඩ) | චමිල් රංගික මහතා | 0718038114 |
| 6 | ගම්පහ (15,17,20වයස් කාණ්ඩ) | | යමුනා හපුආරච්චි මහත්මිය | 0718075084 |
| 7 | කෑගල්ල | | ඉන්දික ජයවර්ධන මහතා | 0718395830 |
| 8 | රත්නපුර | | ජී.ඩබ්.ප්‍රියදර්ශන මහතා | 0718585774 |
| 9 | මොණරාගල | | රංජිත් දිසානායක මහතා | 0714463270 |
| 10 | බදුල්ල | | රංජිත් දිසානායක මහතා | 0714463270 |
| 11 | නුවරඑළිය | | වී.ශිවකුමාර් මහතා | 0718873696 |
| 12 | මහනුවර | | අශෝක ඒකනායක මහතා | 0775910542 |
| 13 | පොළොන්නරුව | | රෝහිණී වසන්තා මහත්මිය | 0718319548 |
| 14 | අනුරාධපුර | | ඉන්ද්‍රාණී ජයසේකර මහත්මිය | 0718076733 |
| 15 | කුරුණෑගල (7,9,11 වයස් කාණ්ඩ) | | එස්.චන්ද්‍රරත්න මහතා | 0710627292 |
| 16 | මාතලේ | | අශෝක ඒකනායක මහතා | 0775910542 |
| 17 | මඩකලපුව | | කේ.සිවනේෂන් මහතා | 0718396848 |
| 18 | ත්‍රිකුණාමලය | | කේ.සිවනේෂන් මහතා | 0718396848 |
| 19 | පුත්තලම | | රොෂාන් දබරේරා මහතා | 0718255575 |
| 20 | යාපනය | | ඒ.කනකසුන්දරම් මහතා | 0715207222 |
| 21 | කිලිනොච්චිය | | ඒ.කනකසුන්දරම් මහතා<br>කේ.සිවනේෂන් | 0715207222<br>0718396848 |
| 22 | වව්නියා/මුලතිව්/මන්නාරම | | ඒ.කනකසුන්දරම් මහතා<br>එස්.සේගර් මහතා | 0715207222<br>0712932015 |

8. දිස්ත්‍රික් තරගාවළී ප්‍රතිඵල ලේඛණ සියල්ල විදුහල් වෙත තැපැල් මගින් එවීම ප්‍රායෝගික නොවන බැවින්
http://www.chess-results.com/fed.aspx?lan=1&fed=SRI

යන වෙබ් අඩවියට පිවිස එම තොරතුරු ලබා ගත යුතුය.

තරගාවලි පිළිබඳ වැඩිදුර විස්තර සඳහා අදාල සම්බන්ධතා පහත දක්වා ඇත.

| | | | | |
|---|---|---|---|---|
| 1. | තරගාවළී කමිටු ලේකම් | -ඉන්ද්‍රාණී ජයසේකර මහත්මිය | 0718076733 | *ralapanawa63@gmail.com* |
| 2. | තරගාවළී කමිටු සභාපති | -කේ.චරිත කුමාර පියලත් මහතා | 0710742177 | *kpckpiyalath@gmail.com* |
| 3. | ගරු භාණ්ඩාගාරික | -ප්‍රියන්ති කුරේ මහත්මිය | *0714924923* | *priyanthicooray1@gmail.com* |
| 4. | ගරු ලේකම් | -එල් .ආර්.එම්.එච්.ඩී. රත්නායක මහතා | 0717301788 | *hemanthachess@gmail.com* |
| 5. | ගරු සභාපති | -කේ.එච්.රංජිත් තිලකරත්න මහතා | 0771187417 | *ranjitthilakaratne@gmail.com* |

මෙම සියළු ලිපින වලට එක්වරම විද්‍යුත් තැපැල් යැවීම සඳහා පහත දැක්වෙන ලිපින එකතුව පිටපත් කර ගත හැකිය.
*hemanthachess@gmail.com,priyanthicooray1@gmail.com,hemanthachess@gmail.com,kpckpiyalath@gmail.com,ralapanawa63@gmail.com*
මෙම ක්‍රියාවලියෙහි ලා ඔබ සියළු දෙනාම සක්‍රියව දායකවනු ඇතැයි බලා පොරොත්තු වෙමු.

ස්තුතියි,මෙයට :
සංගමයේ අණපරිදි,

අත්සන් කළේ,
එල්.ආර්.එම්.එච්.ඩී.රත්නායක ,
ගරු ලේකම් ,
ශ්‍රී ලංකා පාසල් චෙස් සංගමය ,
කලවාන .
ර /කලවාන ජාතික පාසල .

කේ .එච් .රන්ජිත් තිලකරත්න
ගරු සභාපති ,ශ්‍රී ලංකා පාසල් චෙස් සංගමය ,
විදුහල්පති(අධ්‍යාපන පරිපාලනසේවය) 111 -
ගා /ශාන්ත ඇලවීෂියස් විද්‍යාලය,
ගාල්ල.